වී අලෙවි මණ්ඩල සතු වී තොග ලබා ගැනීම සඳහා වන කොන්දේසි සහ නියමයන්

1. වී අලෙවි මණ්ඩලය සතු වී තොග ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල/ ප්‍රාදේශිය කාර්යාලය වෙතින් 2026/11/09 දින පෙ.ව.09.00 සිට 2026/11/30 දින දක්වා රාජකාරී වේලාවන්වලදී ලබා ගත හැක.
2. වී තොග නිකුත් කිරීමේදී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් පදනම මත සිදු කරනු ලබන බැවින් ප්‍රාදේශිය /ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගන්නා ලද අයදුම්පත්‍රය කඩිනමින් සම්පූර්ණ කර ප්‍රාදේශිය කාර්යාලයට/ ප්‍රධාන කාර්යාලයට භාර දිය යුතු වේ.
3. ප්‍රාදේශිය කාර්යාල විසින් අයදුම්පත්‍ර භාරගත් පසු දිනය සහ වේලාව නිවැරදිව සටහන් කර ප්‍රධාන කාර්යාලය ලැබීමට සැලැස්වනු ලැබේ.
4. සුදු/රතු නාඩු වී කිලෝග්‍රෑම් 01ක් රු.124.60ක මිලකට අලෙවි කරනු ලබයි. අලෙවි කිරීමට අපේක්ෂිත වී ප්‍රමාණය මෙ.ටොන් 100,000කි.
5. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ඇති ඇමුණුම 1 - "මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය" ලේඛනය භාවිතා කළ යුතුය. ඉල්ලුම් කරන ගබඩාව සහ ප්‍රමාණය පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙහිදී ගබඩා කිහිපයකට වුවද අයදුම් කළ හැකිය. ඉල්ලුම්කරන ගබඩා පැහැදිලිව තීන්තෙන් හෝ පරිගණක මඟින් ලියා තිබිය යුතුය. අසම්පූර්ණ ලේඛන භාරගනු නොලැබේ.
6. ගබඩාවක පවතින සම්පූර්ණ තොගයට හෝ ඉන් කොටසකට ඉල්ලුම් කළ හැක.
7. පවතින වී තොගවල භෞතික තත්වය 2026/11/09 දින සිට 2026/11/30 දින දක්වා රාජකාරී වේලාවන් වලදී පරීක්ෂා කර බැලිය හැක.
8. ප්‍රධාන කාර්යාලය වෙත දෙනිකට ලැබෙන අයදුම්පත්‍ර අධ්‍යනය කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරු වෙත ලබා දිය හැකි වී ප්‍රමාණය සහ ගෙවිය යුතු මුදල ලිඛිතව ගැනුම්කරුවන් වෙත වී තොග පිරිනැමීමේ ලිපිය මඟින් දැනුම් දෙනු ඇත. මෙම දැනුම්දීම E-mail හෝ WhatsApp මඟින් සිදු කරනු ලැබේ.
9. එසේ ප්‍රාදේශිය කාර්යාල වෙත ලැබුණු වී නිකුත් කිරීම සඳහා තැන්පත් කරන ලද මුදලට අදාල රිසිට්පත් ප්‍රාදේශිය කළමණාකරු විසින් සහතික කර ප්‍රධාන කාර්යාලයට e-mail හෝ WhatsApp මඟින් යොමු කරනු ලබයි. ඉන් පසු ප්‍රධාන කාර්යාලය විසින් තොග නිකුත් කිරීමේ නියෝග නිකුත් කරනු ලබයි.

10. නොග නිකුත් කිරීමේ නියෝගය ලබාගත් දින සිට දින 30 ක් ඇතුලත වී නොග බැහැර කර ගත යුතු අතර වී බැහැර කර ගැනීමේ සියලු පිරිවැය ගැණුම්කරු විසින් දැරිය යුතුය.

11. ගැනුම්කරු ඉල්ලුම් කරනු ලබන ගබඩාවක වී නොග අවසන් වන තුරු ලබා ගැනීමට කටයුතු කල යුතු අතර වී නොග පරීක්ෂා කර අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන බැවින් වී නොග ප්‍රතික්ෂේප කිරීමට හිමිකම් නොමැත.

12. ඉහත සඳහන් කොන්දේසි සහ නියමයන් කඩකරන ගැණුම්කරුවන්ට ඉදිරියේ දී වී අලෙවි මණ්ඩලය සමඟ ගණුදෙනු කළ නොහැකි පරිදි අසාදු ලේඛනගත කිරීමට කටයුතු කරනු ලැබේ.

13. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයේ ගණකාධිකාරී විමසන්න (දුරකථන අංක 011- 2335414)

.....

සභාපති

වී අලෙවි මණ්ඩලය

.....

නිකුත් කරන නිලධාරියාගේ අත්සන සහ මුද්‍රාව

.....	.....	.....
ඉල්ලුම් කරුගේ නම	අත්සන	දිනය